DOI: 10.31357/fhssmph.2011.00088

# සංස්කෘත ආඛ්‍යාත පද නිෂ්පත්තිය විෂයෙහි ලකාරප්‍රයෝගය

21 FEB 2011

# සංස්කෘත ආඛ්‍යාත පද නිෂ්පත්තිය විෂයෙහි

# ලකාරප්‍රයෝගය

(පාණිනිය ව්‍යාකරණය ආශ්‍රයෙන් කරනු ලබන විමර්ශනයකි.)


**මාවතගම පේමානන්ද හිමි**

**GS/HU/509/98**


**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා**

**සංස්කෘත විෂය යටතේ ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධය**

**2009 දෙසැම්බර්**

# අපේක්ෂකයා ගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ සහ මහාචාර්ය ජේ. වෝල්ටර් මාරසිංහ යන සදුපදේශකවරුන් ගේ සුපරීක්ෂාව යටතේ මාවතගම පේමානන්ද හිමි වන මා විසින් සම්පාදනය කරන ලද බවත් මෙහි ඇතුළත් පරිච්ඡේදයක් හෝ කොටසක් වෙනත් නිබන්ධයකින් හෝ ප්‍රකාශනයකින් නිසි සේ සඳහන් කිරීමකින් තොර ව උපුටා නොගත් බවත් මේ නිබන්ධය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් 2010.11.19 දින පැවති වාචික පරීක්ෂණයේ දී නිබන්ධ පරීක්ෂකවරුන් විසින් පෙන්වා දෙන ලද සංශෝධන සියල්ල සදුපදේශකවරුන් ගේ අධීක්ෂණය හා උපදෙස් පරිදි නිසිලෙස සම්පූර්ණ කළ බවත් සහතික කරමි.

18.02.2011

දිනය

මාවතගම පේමානන්ද හිමි

GS/HU/509/98

## සදුපදේශකවරුන් ගේ ප්‍රකාශය

පහත අත්සන් කරන ලද අප ගේ සුපරීක්ෂාව යටතේ මාවතගම පේමානන්ද හිමි විසින් සකස් කරන ලද "සංස්කෘත ආඛ්‍යාත පද නිෂ්පත්තිය විෂයෙහි ලකාරප්‍රයෝගය (පාණිනිය ව්‍යාකරණය ආශ්‍රයෙන් කරනු ලබන විමර්ශනයකි.)" නැමති මෙම නිබන්ධය, ඒ පිළිබඳ ව 2010.11.19 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දී පැවති වාචික පරීක්ෂණයේ දී නිබන්ධ පරීක්ෂකවරුන් විසින් පෙන්වා දෙන ලද සංශෝධන සියල්ල නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් සංස්කරණය කර ඇති බවත් මෙම සංශෝධිත නිබන්ධ පිටපත් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට භාර දීමට සුදුසු තත්ත්වයක පවතින බවත් සහතික කරමු.

2011.02.18
.....................................
දිනය

.....................................
ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ

2011/02/18
.....................................
දිනය

.....................................
මහාචාර්ය ජ්. වෝල්ටර් මාරසිංහ

# පිදුම

මට ජීවය දුන් සෙනෙහෙබර **මව්පිය දෙපලටත්**

පැවිදිසුව ලබා දී මගේ දිවිමග තැනූ ගෞරවාදර

**ගුරුදේවයාණන් වහන්සේලා දෙනමටත්**

සිප්සතරින් දිවිය පුරා ඥානාලෝකය පැතිරවූ පූජනීය **ආචාර්යෝත්තම වෘන්දයටත්**

සදාශ්‍රය ලබා දෙන **සහචාරී පර්ෂදයටත්**

ඉමහත් බැතිබර සෙනෙහසින්

මෙම ග්‍රන්ථය පිළිගන්වමි.

## සදුපකාර පූජා

මා ගේ දිවිගමනෙහි රැකවරණය හා දියුණුවෙහිත් සියලු කටයුතු සාර්ථක විමෙහිත් මා අත්දුටු පරම ශක්තිය වන අනුත්තම රත්නත්‍රයට නමස්කාරපූර්වකාභිවාදනය වේ වා.

මේ අධ්‍යනය හා සම්බන්ධ ප්‍රධාන මූලාශ්‍රය වන අෂ්ටාධ්‍යායිකාරක පාණිනි ආචාර්ය වරයාණනට ද ඊට කාශිකා නමින් වෘත්තියක් කළ වාමන, ජයාදිත්‍ය ආචාර්ය වරුන් දෙපලට ද අනෙකුත් පරිවාර ව්‍යාඛ්‍යාන සම්පාදක සියලු ආචාර්යවරුන්ට ද පාණිනිය ව්‍යාකරණයට ඉංගිලිසි ව්‍යාඛ්‍යානයක් කළ ශ්‍රීශ චන්ද්‍ර වසු විද්වතාට ද මේ අධ්‍යයනයේ දී අපට ඉවහල් වූ සකලවිධ ශාස්ත්‍රීය නිර්මාණ හා ලේඛන සමුත්පාදක සමස්ත සුධීන් පර්ෂදයට ද මේ ප්‍රස්තුතය විෂයෙහි අධ්‍යයනමාර්ග විවෘත කළ පුරෝගාමී විද්‍යාර්ථීන්ට ද ප්‍රථමයෙන් ම ශිර්ෂ ප්‍රණාමය පිරිනමමි.

මට ජිවත් වෙන්නටත් වැඩ කරන්නටත් ශක්ති සම්පන්න ජිවිතයක් නිර්මාණය කර දුන් මා ගේ ජිවිතයේ සමාරම්භක භාගයේ රක්ෂක, පෝෂක, ශික්ෂක මහාබලවේගය වූ මා වින්ද ගුණසුවඳේ උපත වූ සෙනෙහසේ උල්පත වූ බී. එම්. ටිකිරි මැණිකේ, ආර්. ආර්. ආර්. පී. ඩබ්ලිව්. රණවීර බණ්ඩාර යන දයාබර අම්මාට සහ අප්පච්චිට ශුභාශංසන පූර්වක පුණ්‍යානුමෝදනා කරමි.

මා ශාසනික දායාදයන්හි හිමිකරුවකු කොට මට පැවිදි ජිවිතයක් තනා දුන් වත්පිළිවෙත් සහිත පැවිදි ජිවිතයේ රසභර විඳ ගැන්මට මා හුරු කළ මා ලෝක, ශාසන දෙකට හඳුන්වා දුන් කල්‍යාණධර්ම ප්‍රදායක භදන්ත උඩුගොඩ සෝමානන්ද, කහගල සුමනතිස්ස යන අස්මදාචාර්යපාදයාණන් වහන්සේලා දෙනම සමභිවාදනයට ලක් කරමි.

මා ගේ අධ්‍යයන ජිවිතයේ ප්‍රාරම්භක පදනම වූ නික/ කෝන්වැව මහාවිද්‍යාලය, කු/ මාවතගම මධ්‍ය මහාවිද්‍යාලය යන පාසැල්වල ආදරණීය ගුරුවරු ද එහි ගොඩනැඟිමේ හා අභිවර්ධනයේ ඒකාන්ත නියමුවන් වූ රත්තේපිටිය ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙණ, පිළිමතලාව හැරම්ටිගල ශ්‍රී ශාස්ත්‍රාලංකාර පිරිවෙණ, මහනුවර ශ්‍රී සංඝරාජ පිරිවෙණ, හඟුරන්කෙත මාදන්වල ශ්‍රී ධර්මෝදය පිරිවෙණ යන පිරිවෙන්වල පැවිදි, ගිහි ආදරණීය ගුරුවරු ද උසස් අධ්‍යාපන අවදියට පත් මා ගේ අධ්‍යයන ජිවිතය තිරසාර කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ආචාර්ය පර්ෂදය ද

यदत्र सौष्ठवं किञ्चित् तद्गुरोरेव मे न हि । यदत्रासौष्ठवं किञ्चित् तन्ममेव गुरोर्न हि ॥

*(=මෙම උත්සාහයෙහි යම් යහපතක් ඇද්ද එය මා ගේ ගුරුන් ගේ මැ යි; යම් අයහපතක් ඇද්ද එය මා ගේ මැ යි.)* යන සදුක්තිගෝචර ව බැතිකුසුම් පෙරටු ව සම්භාවනාවට බඳුන් වෙති.

මෙම සමස්ත පර්යේෂණ කාර්යාවලියෙහි මහාබලශක්තිය වන්නේ පුරාකෘත පුණ්‍ය මහිමයකින් ම ඇදුරු ව ලබනු විනා අන් කිසි ලෙසකින් නොලද හැකි සරසවි අධ්‍යයන ජීවිතය ඇරඹුමේ පටන් මට දයාබර ගුරුදෙවියකු ව සිටි, මා ගේ මෙම පශ්චාදුපාධි අධ්‍යයනය විෂයෙහි ප්‍රධාන උපදේශකත්වය දැරූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශ ප්‍රධාන, සංස්කෘත ජ්‍යෙෂ්ඨ මහාචාර්යවර ජී. වෝල්ටර් මාරසිංහ ආචාර්යෝත්තමපාදයෝ ය. සරසවි ජීවිතයේ සමාරම්භයේ පටන් ආදරණීය ආචාර්යවරයකු ලෙස මගේ ජීවිතයට සමීප වෙමින් සදුපදේශ දානයෙන් නිවැරදි එල්ලය වෙත අප මෙහෙයවූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශ ප්‍රධාන, ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ආචාර්යෝත්තමපාදයෝ ද්විතීය උපදේශකයාණෝ වෙති.

කාරුණිකත්වයේ දෑත් අප වෙත දිගු කරමින් මෙම අධ්‍යයනය හා සම්බන්ධ ගැටලු සහිත තැන් පහදා දීමට ස්වච්ඡන්දයෙන් ඉදිරිපත් ව සැලකිය යුතු මග පෙන්වීමක් කළ කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති, පූජ්‍යපාද නවගමුවේ රේවත ස්වාමීන්ද්‍රයන් වහන්සේ සම්මානයට පාත්‍ර වෙති. පශ්චාද් උපාධි අධ්‍යයනය විෂයෙහි නැඹුරු කොට එහි ලා නිබඳ ව උනන්දු කරවමින් ඊට අදාළ ප්‍රධාන මූලාශ්‍රයය ද සමග ශාස්ත්‍රීය ලේඛන බොහෝ වක් සම්පාදනය කර දෙමින් මෙම අධ්‍යයනයෙහි පසුබිම් ජවය වූ සදාශ්‍රය සම්පත්තියෙහි ආස්වාදයෙන් එදාමෙදාතුර එක ලෙස අප ව පිණවන යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, පූජ්‍යපාද මාදුරුඔයේ ධම්මිස්සර ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහද මඬලෙහි ගෞරවාර්හ වෙති.

අප ගේ අභිවෘද්ධිය ඉත සිතින් ප්‍රාර්ථනා කරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උපකුලපති, මහාචාර්ය, පූජ්‍යපාද ඉත්තෑදෙමලියේ ඉන්දසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ, භාෂාධ්‍යයන පීඨාධිපති, මහාචාර්ය, පූජ්‍යපාද උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, සංස්කෘත අධ්‍යයනාංශප්‍රධාන, ආචාර්ය, පූජ්‍යපාද නෙලුවේ සුමනවංස ස්වාමීන්ද්‍රයන් වහන්සේ, කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත අධ්‍යයනාංශප්‍රධාන, ආචාර්ය, පූජ්‍යපාද ඉඳුරාගාරේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති, පූජ්‍යපාද ඇඹෝගම

විමලඤාණ ස්වාමීන් වහන්සේ, මහාචාර්ය එස්. ජී. ඒ. විජේසිංහ, කනිෂ්ඨ ශාස්ත්‍රධාරී අරුණ කේ. ගමගේ සත්පුඩිනු මා ගේ අනුස්මරණය බෙජෙති.

මා පසුබිමෙහි අනවරතයෙන් රැඳී සිටින, මෙම අධ්‍යයනය ද ඇතුළු ව සියලු සත්ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගතිය නිබඳ ව විමසමින්, උදාසීන වන විට දිරිමත් කරවමින් සත්සංකල්ප ප්‍රදානයෙන් ද සන්මාර්ග සන්දර්ශනයෙන් ද සදාශ්‍රයෙන් ද මා ගේ ජීවිතයට ජීවය දෙන ප්‍රාණප්‍රිය සන්මිත්‍ර වෛද්‍ය ලලිත් විජේසිංහ සහෘදයා මා ගේ මතකලෝකය තුළ විරාජමාන වෙයි. සදුපදේශයන් වෙත නිතින් යොමු කරවමින් අප ගේ ජීවිතවල අගය අපට ද වඩා දැක දැක අප චිරකල් ජීවත් කරවීමට සකලවිධ ශක්තිය නිරතුරු ප්‍රදානය කරන, සත්පුරුෂගුණ මූර්තියක් බඳු වෛද්‍ය අසංග බණ්ඩාර ශ්‍රීමතාණෝ අප ගේ සිහිවටන් අතර ඉදිරියෙන් සිටිති.

මා ගේ සේවා ජීවිතයේ කුලුදුල් සොඳුරු සිහිවටනය ප්‍රාග් විශ්වවිද්‍යාලය පර්යේෂණ සහායක තනතුර තිළිණ කළ මහනුවර මූලික අධ්‍යයන ආයතනය යි. එහි අධ්‍යක්ෂ මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම, මහාචාර්ය සේනක බණ්ඩාරනායක, ආචාර්ය මාතා ප්‍රිකට් යන සුධීනු මතකයේ රැඳී සිටිති.

මා ගුරු ජීවිතයට නතු කරන පියකරු විදුපියස වන්නේ කැස්බෑව ශ්‍රී විජයසුන්දරාරාම විහාරස්ථ නන්දන පිරිවෙණ යි. මගේ ජීවිතයට පුරුෂාර්ථ සමුදායක් එක් කළ ඒ ජයභූමියට මම ගරු කරමි. පිරිවෙන් ගුරු දිවියේ තවත් ඉදිරි පියවරක් සනිටුහන් වන කිරුළපණ ශ්‍රී පූර්වාරාමස්ථ ශ්‍රී පඤ්ඤාලෝක පිරිවෙණ ප්‍රීතියෙන් සමරමි.

විශ්වවිද්‍යාලයීය ගුරු භූමිකාවේ නැවුම් රසාස්වාදයෙන් මගේ ජීවිතය ආනන්දයට පමුණුවන කැළණිය විශ්වවිද්‍යාලයත් රුහුණ විශ්වවිද්‍යාලයත් යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයත් ජීවිත ඉතිහාසය සරසන සුන්දර මතක සටහන් නැමති සුසුවඳ සුපුෂ්පයන් ය.

සරසවි සිසුදිවියේ සමාරම්භයේ දී මට සෙවන දෙන ගංගොඩවිල ශ්‍රී විජයාරාමයත් සරසවි ගුරුදිවියේ දී මට නිවහන් වන කොටුව ශ්‍රී බෝධිරාජාරාමයත් බෙල්ලන්විල රාජමහාවිහාරයත් කල්‍යාණගුණධාර තද් විහාරාධිපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලා සමග මතක සටහන් අතර වොරැඳේ.

මා ගේ ජීවිතයත් ඉදිරි ගමනත් දෙස නිරතුරු විමසුම් ඇස් අයා සිට මට උපකාර වන සොයුරුසොයුරියන් කැලත් මස්සිනාලා දෙපලත් මට වාසනාවකි.

අවංක සහෝදරප්‍රේමයේ ශක්තිය මට හැමදා මත් දැනෙන්නට සැලැස්වන වරෙක සහෝදරත්වයෙන් ද තව වරෙක කල්‍යාණමිත්‍රත්වයෙන් ද තවත් වරෙක ආරක්ෂකයකු වශයෙන් ද මගේ ජීවිතයට බැඳී සිටින පැවිදි සහෝදර කැටපිටිය පුරාණ විහාරාධිපති, සියඹලාගොඩ ශ්‍රී ප්‍රවචනෝදය පිරිවෙන්පති, ශාස්ත්‍රපති පූජ්‍ය කහගල සුමනජෝති ස්වාමීන් වහන්සේ මේ කාර්යයේ දී ද මට යෝධ බලයකි. අප ගේ අන්තේවාසික ප්‍රිය ශිෂ්‍ය කඹරව සුමනානන්ද, ගල්පෝරුගොල්ලේ සුමේධානන්ද යන දෙනම ද මෙහි ලා ලබා දුන් නොමඳ සහාය පැසසුමට ලක් වේ. මෙම අධ්‍යයනය හැකි ඉක්මනින් නිම කිරීම සඳහා නිබඳ ව දිරිමත් කරමින් යතුරු ලියනය හා සම්බන්ධ කාර්යයන්හි දී අපට සමීප ව සිටිමින් සහාය වූ ඩබ්ලිව්. පී. එස්. පී. ප්‍රේමරත්න ද සිහිපත් කරමි. අන්තේවාසික ප්‍රිය ශිෂ්‍ය කුඹුකන්දන සුධම්මානන්ද නමත් නිකපිටියේ සුමනධම්ම නමත් ඉන්දික විජේසිංහත් බී. පී. සුගත් නිලවීරත් ආර්. පී. ගුණපාලත් මෙහි දී අප ළඟ රැඳි අය අතර වෙති.

සැම විට නිතැතින් මතකයෙහි වෙසෙන අත්‍යුත්තම මානවධර්මතාවන් ගේ සහ පරම ගම්භීර කල්‍යාණ මිත්‍රත්වයේ ප්‍රතිමූර්තීන් බඳු වන දයාබර පී. ලලිත් ආනන්ද මහාත්මා, ඩී. කේ. මැදගම මහාත්මිය යන ආයුර්වේද වෛද්‍යාචාර්ය දම්පති යුවල ද අමෘතා මදුෂාණී, නවෝද්‍යා සංදීපනී යන තද්දාරක දුහිතෘන් දෙපල ද අප වෙත දක්වන ළබැඳියාව අසීමිත වෙයි.

එදාමෙදාතුර මා ඇසුරෙන් සිප්සතර හැදෑරූ ද හදාරන ද පිරිවෙන්හි ද විශ්වවිද්‍යාලයන්හි ද සමස්ත ගිහි, පැවිදි ශිෂ්‍ය පර්ෂදය සාදරයෙන් සිහිපත් කරන්නේ ඔවුන් වෙනුවෙන් කළ ඉගැන්වීම් ද මෙවැනි අධ්‍යනයක් වෙත නැඹුරු වීමට බල පෑ හෙයිනි.

සිවුපසයෙන් අප පෝෂණය කළ හා කරන සැදැහැති දායක, දායිකා සත්පුරුෂ කැල ද මෙහි ලා සම්මානනයට සුදුසු වෙති.

හිතවත් ව අප හා බැඳෙමින් අප ගේ ජීවිතය ආලෝකවත් කිරීමට ප්‍රභාව ලබා දුන්නා වූ ද දෙන්නා වූ ද සියලු පැවිදි, ගිහි සුදන කැල සහෘද ස්නේහයෙන් සිහියට නඟාලමි.

පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි,

මැණික්දිවෙල, කැටපිටිය පුරාණ විහාරයේ දී

ව්‍යවහාර වර්ෂයෙන් 2009ක් වූ දෙසැම්බර් මස 28 දිනැති සඳුදා ය.

# පටුන


| | |
|---|---|
| උපකාරානුස්මෘති | ix |
| සාරාංශය | xiii |
| සංක්ෂේපණවිධි | xiv |
| හැඳින්වීම | xx |
| ප්‍රථම උල්ලාසය : | |
| **ආඛ්‍යාතපද නිෂ්පත්තිය හා ලකාරප්‍රයෝගය** | **001** |
| ද්විතිය උල්ලාසය : | |
| **ආඛ්‍යාතපද විෂයෙහි කාල සූචනය පිළිබඳ ව ප්‍රාක්පාණිනිය ස්වරූපය** | **120** |
| තෘතිය උල්ලාසය : | |
| **දශ ලකාරය පිළිබඳ පාණිනිය ඉගැන්වීම්** | **221** |
| චතුර්ථ උල්ලාසය : | |
| **පාණිනිය ලකාර ඉගැන්වීම් පශ්චාත්කාලින ප්‍රක්‍රියා ග්‍රන්ථවල සංග්‍රහ වී ඇති ආකාරය** | **507** |
| පංචම උල්ලාසය : | |
| **ලකාරප්‍රයෝගය සංස්කෘත සාහිත්‍යය තුළ සංග්‍රහ වී ඇති ආකාරය** | **542** |
| ෂෂ්ඨ උල්ලාසය : | |
| සමෝධානය | 680 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 685 |
| උපග්‍රන්ථය | 697 |
| සූචිය | 713 |

# සාරාංශය

‘සංස්කෘත ආඛ්‍යාත පද නිෂ්පත්තිය විෂයෙහි ලකාරප්‍රයෝගය’ නම් වන මෙම අධ්‍යයනය ‘අෂ්ටාධ්‍යායී’ නමැති පාණිනීය ව්‍යාකරණය ආශ්‍රය කොට කරනු ලබන විමර්ශනයකි. සංස්කෘත භාෂාවේ ආඛ්‍යාත පද වරනැඟීම හා සම්බන්ධ ‘දශලකාර’ යන නමින් හැඳින්වෙන ආඛ්‍යාත විභක්ති දහය ‘පාණිනි’ නම් ව්‍යාකරණාචාර්යවරයා විසින් නිර්මාණය කරනු ලැබීමේ විද්‍යාත්මක පදනම විමසුමට ලක් කිරීමත් ඒවා සප්‍රභේද ව සහ සසාධක ව විවරණය කිරීමත් මෙම පර්යේෂණයෙහි මුඛ්‍යතම අපේක්ෂණය වෙයි. එහෙයින් මෙම අධ්‍යයනය සංස්කෘත භාෂාවේ ආඛ්‍යාත පද වරනැඟීම පිළිබඳ එක්තරා ශාස්ත්‍රීය විචාරයක් වශයෙන් හැඳින්විය හැකි ය.

ආඛ්‍යාත පදයක් ගොඩනැඟීමේ ක්‍රියාවලියේ දී අවධානයට ලක් කළ යුතු ධාතු, විකරණාදි මූලික කරුණුත් එකී ආඛ්‍යාත අංගප්‍රත්‍යයාංගාදිය එකට එක් වෙමින් ක්‍රියාංගාදිය නිර්මාණය වීමේ තාක්ෂණික ක්‍රමවේදයත් ඒ සමග ආඛ්‍යාතික හෙවත් දශලකාර ප්‍රත්‍යයාදිය එක් වන ආකාරයත් ඇතුළු ව සංස්කෘත ක්‍රියා පදයක නිෂ්පත්තිය සම්බන්ධ බොහෝ ප්‍රාරම්භක කරුණු ඉදිරිපත් කෙරෙන ප්‍රථම පරිච්ඡේදය සංස්කෘත ආඛ්‍යාත පද විචාරය විෂයෙහි පෙරවදනක් බඳු වෙයි.

සංස්කෘත ආඛ්‍යාත වරනැඟීම් රටාවන්හි නොහොත් විභක්තීන්හි පුරාතන ස්වභාවය පරීක්ෂාවට බඳුන් කරමින් තදීය ඓතිහාසික ක්‍රමවිකාශය අනාවරණය කිරීමට දරණ ලද පරිශ්‍රමයක් වශයෙන් සැලකිය හැකි ද්විතීය පරිච්ඡේදය සංස්කෘත ආඛ්‍යාත වරනැඟීම පිළිබඳ ප්‍රාක්-ස්වරූප කථනයකි.

දශලකාර හා සම්බන්ධ සකලවිධ පාණිනීය විග්‍රහයන් විචාරයට ලක් කෙරෙන තෘතීය පරිච්ඡේදය මෙම අධ්‍යයනයෙහි මර්මස්ථානය වෙයි. පාණිනි ගේ ලකාර ඉගැන්වීම් පශ්චාත්කාලීන සංස්කෘත ව්‍යාකරණ නිර්මාණයන් විෂයෙහි බලපා ඇති අයුරු විමැසෙන චතුර්ථ පරිච්ඡේදයත් පාණිනීය නිර්දේශයන් මත සාදන ලද ආඛ්‍යාත රූප සංස්කෘත සාහිත්‍යයෙහි හැසිරෙන ආකාරය පිළිබිඹු කරන පඤ්චම පරිච්ඡේදයත් ලකාර විෂයෙහි පාණිනීය ඉගැන්වීම් පිළිබඳ අපරකාලීන ක්‍රමවිකාශය ප්‍රදර්ශනය කෙරෙන වේදිකා යුග්මයක් බඳු වෙයි.

## සංක්ෂේපණවිධි

### 1. ව්‍යාකරණ

ආ. = ආත්මනෙපද / ආත්මනෙපද ලකාර ප්‍රත්‍යයය

උ. = උත්තමපුරුෂ

ඒ. = ඒකවචන

කකා. = කර්තෘකාරක

කමකා. = කර්මකාරක

කමක. = කර්මකර්තෘක

ණි. = ණිජන්ත (ප්‍රයෝජ්‍යාර්ථක)

ද්වි. = ද්විවචන

නා. = නාමධාතුක

ප. = පරස්මෛපද / පරස්මෛපද ලකාර ප්‍රත්‍යයය

ප්‍ර. = ප්‍රථමපුරුෂ

බ. = බහුවචන

භාකා. = භාවකාරක

ම. = මධ්‍යමපුරුෂ

ය. = යඞන්ත (අතිශයාර්ථක / පෞනඃපුන්‍යාර්ථක)

ස. = සන්නන්ත (ඊප්සාර්ථක)

සිඅ. = සිංහල අකුරු

සූ. = සූත්‍රය හෝ සූත්‍ර

A. = ආත්මනෙපදී

P. = පරස්මෛපදී

U = උභයපදී

## 2. සාහිත්‍ය ග්‍රන්ථාදිය

| | | |
|---|---|---|
| අධ. | = | අෂ්ටාධ්‍යායී |
| අභිශා. | = | අභිඥානශාකුන්තල |
| අසූපා. | = | අෂ්ටාධ්‍යායී සූත්‍රපාඨය |
| උරා. | = | උත්තරරාමචරිත |
| ඍග්. | = | ඍග්වේද |
| ඓබ්‍රා. | = | ඓතරෙය බ්‍රාහ්මණ |
| ඓවාප්‍ර. | = | ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය |
| කිරා. | = | කිරාතාර්ජුනීය |
| කුමාර. | = | කුමාරසම්භව |
| කෞබ්‍රා. | = | කෞෂිතකී බ්‍රාහ්මණ |
| චාශ. | = | චාණක්‍යශතක |
| ඥාශකො. | = | ඥාන ශබ්ද කොශ්, |
| තිලකසිරි | = | වෛදික සාහිත්‍යය, තිලකසිරි, ජේ., කොළඹ 2, 1967 |
| තෛසං. | = | තෛත්තිරීය සංහිතා |
| දශකු. | = | දශකුමාරචරිත |
| ධාරූම. | = | ධාතුරූපමඤ්ජරී |
| නීති. | = | නීතිශතක |
| ප. | = | පඤ්චතන්ත්‍ර |
| පරිව. | = | පරිවර්තක |
| පා. | = | පාණිනි |
| පාව්‍යාස. | = | පාලි අට්ඨකථාවන්හි පිළිබිඹු වන ව්‍යාකරණ සම්ප්‍රදාය |
| පාස. | = | පාදක සටහන/ සටහන් |
| පිප්‍ර. | = | ශ්‍රී පියරතන ප්‍රශස්ති |
| ප්‍රාශාසං. 1996. | = | ශාස්ත්‍රීය සංග්‍රහය, 1996 |
| ප්‍රාශාසං. 1997. | = | ශාස්ත්‍රීය සංග්‍රහය, 1997 |

| | | |
|---|---|---|
| බාටී. | = | බාලාවතාර ටීකා |
| බාලා. | = | බාලාවතාර |
| බෘහිකෝ. | = | බෘහත් හින්දි කොශ්, |
| භට්ටි. | = | භට්ටිකාව්‍ය |
| මච. | = | මහාවීරචරිත |
| මහා. | = | මහාභාරත |
| මාල. | = | මාලවිකාග්නිමිත්‍ර |
| මාලතී. | = | මාලතීමාධව |
| මුරා. | = | මුද්‍රාරාක්ෂස |
| මෘක. | = | මෘච්ඡකටික |
| මෙඝ. | = | මෙඝදූත |
| මෛසං. | = | මෛත්‍රායණී සංහිතා |
| යාඥ. | = | යාඥවල්ක්‍යස්මෘති |
| රඝු. | = | රඝුවංශ |
| රා. | = | රාමායණ |
| ලඝු. | = | ලඝුසිද්ධාන්තකෞමුදී |
| ලෞකික හෝ ලෞ. | = | ලෞකික සංස්කෘත |
| වාප. | = | වාක්‍යපදීය |
| වි. | = | වික්‍රමෝර්වශී |
| විදුලකර. | = | විදුලකර |
| විශාසං. 1995 | = | විද්‍යාලංකාර, ශාස්ත්‍රීය සංග්‍රහය, 1995 |
| විස්තරාර්ථසාර. | = | විස්තරාර්ථ සහිත සාරස්වතාඛ්‍යාත ව්‍යාඛ්‍යානය |
| වෘත්ත. | = | වෘත්තරත්නාකර |
| ව්‍යාසසි. | = | ව්‍යාකරණසද්දසින්ධු |
| වෛදික හෝ වෛ. | = | වෛදික භාෂාව (–සංස්කෘත) |
| වෛරා. | = | වෛරාග්‍යශතක |

| | |
|---|---|
| ශකප්‍ර. | = ශබ්දකල්පද්‍රැම, ප්‍රථම කාණ්ඩය |
| ශකද්වි. | = ශබ්දකල්පද්‍රැම, ද්විතිය කාණ්ඩය |
| ශතොම. | = ශබ්දස්තොමමහානිධි |
| ශබ්‍රා. | = ශතපථ බ්‍රාහ්මණ |
| ශිශු. | = ශිශුපාලවධ |
| ශ්‍රීප්‍රිප්‍ර. | = ශ්‍රී ප්‍රියරත්න ප්‍රශස්ති |
| සප්‍රව. | = සංස්කෘත ප්‍රවේශ ව්‍යාකරණය |
| සම්පා. | = සම්පාදක |
| සසංශි2. | = සරල සංස්කෘත ශික්ෂකය, ද්විතිය පුස්තකය |
| සසංශි3. | = සරල සංස්කෘත ශික්ෂකය, තෘතිය පුස්තකය |
| සං. | = සංස්කෘත |
| සංකාසා. | = සංස්කෘත කාව්‍ය සාහිත්‍යය |
| සංග්‍ර. | = සංස්කෘත ග්‍රන්ථවංශය |
| සංනාවි. | = සංස්කෘත නාමාඛ්‍යාත විවරණය |
| සංප්‍රපු. | = සංස්කෘත ප්‍රථම පුස්තකය |
| සංව්‍යාත. | = සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී |
| සංව්‍යාශි. | = සංස්කෘත ව්‍යාකරණ ශික්ෂා |
| සංශශා. | = සංස්කාත ශබ්ද ශාස්ත්‍රය |
| සංශිප්‍ර. | = සංස්කෘත ශික්ෂකය ප්‍රථම පුස්තකය |
| සංශිද්වි. | = සංස්කෘත ශික්ෂකය ද්විතිය පුස්තකය |
| සංසා. | = සංස්කෘත සාහිත්‍යය |
| සංසාඉ. | = සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය |
| සංසාප්‍ර. | = සංස්කෘත සාහිත්‍ය ප්‍රවේශය |
| සංස්කා. | = සංස්කාරක |
| සාර. | = සාරස්වත |
| සාරච. | = සාරස්වත චන්ද්‍රකීර්තිව්‍යාඛ්‍යාව |